# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව ඉදිරිපිට දී ය.

ඩබ්. වී. ඩී. එස්. පුෂ්පකුමාර එ. රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව

RTIC Appeal (ලේඛනගත කාර්යය පටිපාටිය)/ 2087/2020 (2020.08.18 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).
2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය)**,** රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ කිශාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජ්‍යෙෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්:** ඩී.ජී.එම්.වී. හපුආරච්චි

**අභියාචක** ඩබ්. වී. ඩී. එස්. පුෂ්පකුමාර
**නොතිසි ලත් පාර්ශවය** නම් කල නිලධාරී**, රජයේ** තක්සේරු දෙපාර්තමේන්තුව

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019.12.10 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | නියමිත කාලය තුල ප්‍රතිචාරයක් නොමැත නමුත් 2019.12.30 දිනැතිව ප්‍රතිචාර දක්වා ඇත. |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019.12.27 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | ප්‍රතිචාරයක් නොමැත |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2020.01.17 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් 2019.12.10 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

i. පුවත්පත් දැන්වීමට කිසිසේත්ම අදාළ නොවූ ආකාරයෙන් රජයේ නිලධාරියෙකු යොමුකළ පැමිණිල්ලක් ඔහුගේ නිලබලය/තරාතිරම පදනම්ව අසමාන අයුරින් සලකා බලමින් සීතාවක සහකාර ප්‍රා.ලේ. කළ ඉල්ලීමක් අනුව යැයි පවසා එම පොදු අධිකාරියේ නිලධාරීන් විසින් පළමුව මා හට අනුමත වන්දි මුදල කප්පාදුවන අයුරින් මාගේ නිවසේ වහලයේ මුල් හානි නිරීක්ෂණය නොවී හා මැන පරීක්ෂා නොකර උළු වහලය අඩි 800කට සාවද්‍යව වෙන්කර පළමුව අනුමත තක්සේරු මුදල සාවද්‍යව කපා හැරීම, ආලින්දයට සෙවිලිකර ඇති අඩි අ2 ඇස්බැස්ටස් තහඩුවල දිග ප්‍රමාණය දෙවන පරීක්ෂාවේදී අඩි 8 දක්වා සාවද්‍යව අඩුකිරීම හා එය නිවැරදිව පරීක්ෂා කළ බවට සාවද්‍යව තහවුරු කිරීම. 2x2 ප්‍රමාණයේ ජනේල පියන් කිසිවක් කිසි දිනක නිවසේ සවිකර නිතිබියදී එවැනි ජනේල පියන් 4කට හානි සිදු වී ඇති බවට සාවද්‍යව ඇතුළත් කිරීම හා එහි නිවැරදිතාවය "පරීක්ෂා කළ බවට" සාවද්‍යව වාර්තා කිරීම, හානිවූ වැසිකිළි වලේ කොන්ක්‍රීට් ආවරණයට සිදු වූ හානි සඳහා පළැමු තක්සේරුවේදී වර්ග අඩි 24කට අනුමත කර තිබූ පිරිවැය

ගානි නිරීක්ෂණය නොවූ හා මැන පරීක්ෂා නොකළ දෙවන පරීක්ෂාවේදී අමානුෂික ලෙස මුළුමනින්ම කපා හැරීම. පළමු පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ 3x6 ප්‍රමාණයේ (සාමාන්‍ය ) ජැනෙල් දොරවල් 2ක්, නිවස අලුත්වැඩියාවේදී ගලවා ඉවත්කර තිබියදී එහි පළමු අනුමත ප්‍රතිස්ථාපන පිරිවැය, හානි නිරීක්ෂණය නොවූ හා මැන පරීක්ෂා නොකළ දෙවන පරීක්ෂාවේදී සාවද්‍යව කපා හැරීම. වර්ග අඩි 100ක සිමෙන්ති පොළවට සිදු වූ හානි සඳහා පළමුව අනුමත ප්‍රතිස්ථාපන පිරිවැය, හානි නිරීක්ෂණය නොවූ හා මැන පරීක්ෂා නොකළ දෙවන පරීක්ෂාවේදී සාවද්‍යව කපා හැරීම. නිවසේ බිත්ති සියල්ල කපරාරු කර පොට් ඇද තීන්ත ආලේප කර තිබියදී කිසිදු හානි සලකුණක් නොදැක හා මැන පරීක්ෂා නොකර සිදුකළ නැවත පරීක්ෂාවේදී ඒ සඳහා සාවද්‍ය වූ අඩු හානි වාර්තා කරමින් ග්‍රාම නිලධාරී වෙතින් සාවද්‍ය දිනයක් යටතේ අත්සන් ලබාගෙන එම පරීක්ෂාව සම්බන්ධයෙන් නිවසේ හිමිකරු වන මාගේ බිරිඳගෙන් අත්සන් ලබා නොගැනීම යනාදී සාවද්‍ය කාරණා 28ක් යටතේ පෙර තක්සේරු නිලධාරීන්ගේ සටහන් වෙනස්කර/ විකෘතකර වංචනික ලේඛනයක් සැකසීම, තසේරු දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාපටිපාටිය අනුව විධිමත්ව කළ සංශෝධනයක් බව දැක්වීමට එක් එක් කරුණ යටතේ පදනම් කරගත් ප්‍රතිපත්තිමය කාරණා මොනවාද යන්න පිළිබඳ තොරතුරු

ii. ඉහත ආපදාවට අදාළ තක්සේරු කිරීම් කටයුතුවලදී එම පොදු අධිකාරියේ ඩබ්.සී.ඊ, පෙරේරා මහත්මියට හා කේ.කේ.එල්. රාජකරුණා මහතාට පවරා තිබූ වගකීම/ රාජකාරිය කුමක්ද යන්න හා එම වගකීම් ඉටුකිරීම ආරම්භවූ දිනය හා අවසන් වූ දිනය කුමක්ද යන්න පිළිබඳ තොරතුරු

iii. මාගේ නිවසට මුලින්ම රු. 853,000.00ක තක්සේරුවක් අනුමත කිරීම සඳහා 2016.06.14 දින තක්සේරු නිලධාරීන් විසින් තම අත්සන් සහ ග්‍රාමනිලධාරී අත්සන සහිතව සැකසූ තක්සේරු වාර්තාවේ පිටපතක් හා නැවත සිදුකළ පරීක්ෂාවේදී එම වටිනාකම රු. 575,000.00 කට අඩුවුන ආකාරයට, තක්සේරු නිලධාරීන් විසින් තම අත්සන් සහ ග්‍රාම නිලධාරී අත්සන් සහිතව සැකසූ වාර්තාවේ හා එම ගොනුවේ වෙනස් කළ /විකෘති කළ සියලු ලියකියවිලිවල පිටපත්

iv. මුල් හානි කිසිත් නොදැක හා මැන පරීක්ෂා නොකර සැකසූ වාර්තාවේ සඳහන්, නිරීක්ෂණය නොවූ හානි, "පරීක්ෂා කළ බවට අත්සන් තැබූ නිලධාරීන්" ගේ නම්/තනතුරු හා අත්සන් කළ දිනය

v. ස්ථානීය පරීක්ෂාව සඳහා කේ.කේ.එල්. රාජකරුණා මහතාවට කලින් නිලධාරීන් දෙදෙනෙකු නිවසට එවූ බවට ඩබ්ලිව්.සී.ඊ. පෙරේරා මහත්මිය 2018.01.26 දින මා සමග සිදුකළ සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලදි. එම කණිෂ්ඨ නිලධාරීන් දෙදෙනා නිවසට පැමිණි දිනය හා ඔවුන්ගේ නම්/තනතුරු මොනවාද යන්න හා ඔවුන් සැකසූ වාර්තාවේ පිටපතක්

vi. කලින් එවූ කණිෂ්ඨ නිලධාරීන් විසින් තමාට යොමුකළ වාර්තාවේ කරුණු තහවුරු කරගැනීමට තමා නිවසට පැමිණි බව කේ.කේ.එල්. රාජකරුණා මහතා 2017.11.17 දින මා සමග සිදුකල සාකච්ඡාවේදී ප්‍රකාශ කරන ලදි. එම කණිෂ්ඨ නිලධාරීන් දෙදෙනා නිවසට පැමිණි දිනය හා ඔවුන්ගේ නම්/ තනතුරු මොනවාද යන්න හා ඔවුන් සැකසූ වාර්තාවේ පිටපතක්

vii. 2016.09.15 දින කේ.කේ.එල්. රාජකරුණා මහතා නිවස පරීක්ෂාවට පැමිණි අවස්ථාවේදී මා නිවසේ සිටි බවත්, එදින ග්‍රාම නිලධාරීතුමිය එම පරීක්ෂාවට සහභාගී නොවී තිබියදී ග්‍රාම නිලධාරිනිය සමඟින් 2016.09.15 දින පරීක්ෂාවට සිදුකළ බවට අත්සන් තබා ඇති නිලධාරීන්ගේ නම්/ තනතුරු හා ඔවුන්ගේ අත්සන් සහිතව සැකසූ වාර්තාවේ පිටපතක්.

viii. සහකාර ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීමක් මත සිදුකළ නැවත පරීක්ෂාවේදී ග්‍රාම නිලධාරීන්ගේ අත්සනින් යුතු වාර්තාවක් සකසා ඇති බව CD/RTI/2017 හා 2018.01.30 දින දරණ ලිපිය මගින් දන්වා ඇති බැවින් ඊට සහභාගී වූ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු හා දිස්ත්‍රික් තක්සේරුකරුගේ නම්/ තනතුරු/ පරීක්ෂා කළ දිනය සමග ඔවුන්ගේ අත්සන් සහිතව සැකසූ වාර්තාවේ පිටපතක්.

ix. ප්‍රාදේශීය ලේකම්ගේ ඉල්ලීමක් මත, මාණ්ඩලික නිලධාරියෙකු විසින් ග්‍රාම නිලධාරීද සමගින් නැවත පරීක්ෂා කොට වාර්තාවක් සකසා ඇති බව CD/RTI/2017 හා 2018.11.27 දින ලිපිය මගින් දන්වා ඇති බැවින් ඊට සහභාගී වූ සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු හා දිස්ත්‍රික් තක්සේරුකරුගේ නම්/ තනතුරු/ පරීක්ෂාකළ දිනය සමග ඔවුන්ගේ අත්සන් සහිතව සැකසූ වාර්තාවේ පිටපතක්.

x. සහකාර දිස්ත්‍රික් තක්සේරුකරු, දිස්ත්‍රික් තක්සේරුකරු හා මාණ්ඩලික නිලධාරීන් විසින් සිදුකලාවූ නැවත පරීක්ෂාවන් අතුරින් ග්‍රාම නිලධාරී සහභාගී වී ඇත්තේ කුමන නිලධාරීන් සමග සිදුකළ පරීක්ෂාවන් සඳහාද යන්න හා ඔවුන්ගේ අත්සන්/ දිනය සහිතව සැකසූ එම වාර්තාවේ පිටපතක්.

xi. හානියට පත්වූ නිවස මාගේ පුද්ගලික වියදමින් ප්‍රතිසංස්කරණය කර තිබියදී එහි මුල්හානි හෝ සුන්බුන් කිසිවක් නොදැක හා මැන පරීක්ෂා නොකර සිදුකළ සාවද්‍ය නැවත පරීක්SHආවකින් පසු ඊට අදාළ තක්සේරු ගොනුවේ මුල් සටහන් වංචනිකවහා කූඨ ලෙස වෙනස්කර/ විකෘතිකර ග්‍රාම නිලධාරීගේද අත්සන් සහිතව තක්සේරු නිලධාරීන් සැකසීම පිළිබඳව හා ඊට මූලික වූ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳව නිරීක්ෂණය කිරීම/සොයා බැලීම සඳහා අදාළ නිලධාරීන් සමඟින් මාගේ නිවසට පැමිණෙන මෙන් 2019.05.17/ 2019.06.27 දින ලිඛිතව කළ දැනුම්දීම්වලට අනුව ක්‍රියාත්මක නොවී සිටීමට පදනම් වූ ප්‍රතිපත්තිමය කාරණාව කුමක්ද යන්න පිළිබඳ තොරතුරු

xii. 2019.01.29 දින මා විසින් කේ.කෙ.එල්. රාජකරුණා යන නිලධාරී පිළිබඳව ප්‍රධාන තක්සේරුකරුට යොමුකළ පැමිණිල්ල සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගවල වත්මන් තත්වය

සාවද්‍යව තක්සේරුව සිදුකළ ආකාරය දැනගැනීමට අදාළ තොරතුරු ඉල්ලා සිටි අවස්ථාවේදී ඒ සඳහා කුමන්ත්‍රණකාරීව නිලධාරීන් මෙහෙයවූ එවකට පළාත් තක්සේරුකාරතුමිය විසින් තමා "පළාත් තක්සේරුකාර" ධූරය දරමින් සිදුකළ එම ක්‍රියා වසන් කිරීමේ අරමුණින් හා එතුමිය සමග ඍජුවම සම්බන්ධ වී වංකව ක්‍රියාකළ දිස්ත්‍රික් තක්සේරුකාර මහතා හා ඔවු යටතේ වූ "කණිෂ්ඨ නිලධාරීන්" ආරක්ෂා කිරීම සඳහා එම පොදු අධිකාරියේම තොරතුරු නිලධාරීව සිටිමින් පවතින නීතිරීති/ අණපනත්/ මූලික සදාචාරත්මක මූලධර්මයන් උල්ලංඝණය කරමින් තම බලයෙන් ඔබ්බට ක්‍රියාත්මක වී එම "පළාත් තක්සේරුකාර" ධූරය හා "තොරතුරු නිලධාරී තනතුර" මෙන්ම රටේ ප්‍රධාන තනතුරක් වූ "නීතිපතිවරයාගේ තනතුරු නාමයද" අනිසි ලෙස භාවිත කරමින් බලධාරීන්ට හා මා වෙත අසත්‍ය තොරතුරු වාර්තා කර ඇති බැවින් ඒ පිළිබඳව නිසි පරිදි ක්‍රියාත්මකවීම සඳහා පහත තොරතුරු ලබාදෙන මෙන්ම ඉල්ලමි.

i. LO/VAL/03/AGO-RTI හා 2017.03.24 දින නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකළ එම දෙපාර්තමේන්තු ලිපියේ පිටපතක්

ii. LO/VAL/03/AGO-RTI හා 2017.03.24 දින ලිපියට අනුව 2017.05.26 දින නීතිපතිවරයාගෙන් පැහැදිලි උපදෙසක් ලැබී නොමැති බවට අර්ථ ගන්වමින් /01/07-0019 හා 2018.01.03 දින ලිපිය මා වෙත ඉදිරිපත් කිරීම මා රැවටීමට ලක්කිරීමක්ද යන්න හෝ ඒ පිළිබඳව වෙනත් ලිපියකින් උපදෙස් ඉල්ලා ඇත්නම් එම ලිපියේ පිටපතක් ලබාදෙන්න.

iii. E/112/2017 හා 2017.05.26 දින නීතිපතිවරයා විසින් එම දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ ලිපියට අනුව මාගේ තොරතුරු ලබාදීමට බාධාවක් නොමැති බව පැහැදිලි වන බැවින් එම තොරතුරු ලබා නොදීමට හේතුව කුමක්ද යන්න හා ප්‍රශ්නකාරී නම් එම සිදුවීමට අදාළව නැවත උපදෙස් ලබා නොගැනීමට පදනම් වූ ප්‍රතිපත්තිමය කාරණා මොනවාද යන්න පිළිබඳ තොරතුරු ලබා දෙන්න.

පොදු අධිකාරියෙහි තොරතුරු නිලධරයා ප්‍රතිචාර නොදැක්වීමේ පදනම පත අභියාචක විසින් 2019.12.27 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධරයා ද ප්‍රතිචාර නොදැක්වීමේ පදනම පත අභියාචක විසින් 2020.01.17 දිනැතිව කොමිෂන් සභාවවෙත අභියාචනයක් යොමු කරන ලදී.
තොරතුරු නිලධරයා විසින් 2020.03.02 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමු කරන ලද ලිපියක් මගින් මෙම අභියාචනයට අදාළ තොරතුරු ඉල්ලීම ඇතුළු අභියාචක විසින් සිදු කරන ලද තොරතුරු ඉල්ලීම් 16කට සහ නම්කළ නිලධාරී වෙත කරන ලද අභියාචනා 9කට ප්‍රතිචාර දක්වන ලද දින සහ ලියාපදිංචි අංකය සඳහන් කරමින් වගු ගත කොට ඇත. ඒ අනුව පෙනී යන්නේ තොරතුරු නිලධරයා විසින් 2019.12.30 දිනැතිව තොරතුරු ඉල්ලීමට ප්‍රතිචාර දක්වා ඇති බවයි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

කොමිෂන් සභාවෙහි නොතීසි වලට ප්‍රතිචාර දක්වමින් පොදු අධිකාරිය 2020.07.29 දිනැති ලිපිය මගින්ද මෙය තහවුරු වී ඇත. තවද අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු RTIC Appeal /1602/2019 යන අභියාචක විසින්ම ගොනු කර ඇති අභියාචනයට අදාළ තොරතුරු වන බව පැහැදිලි වන අතර ඊට අදාලව 2020.01.28 දිනැති නියෝගය මගින් පොදු අධිකාරිය විසින් 2018.11.28 දිනැතිව සවිස්තර වාර්තාවක් ලබා දීම මත හා එයින් අභියාචක විසින් ඉල්ලා ඇති තොරතුරු ආවරණය වීම මත එම අභියාචනය අවසන් කොට ඇත.

**නියෝගය:**

තොරතුරු දැනගැනීමේ පනත ප්‍රකාරව ඕනෑම පුරවැසියකුට තොරතුරු ඉල්ලීමක් යොමු කොට ඊට ප්‍රතිචාරයක් ලබා ගැනීමේ අයිතිවාසිකමක් සහ ඊට ප්‍රතිචාර දැක්වීමේ සබැඳි වගකීමක් පොදු අධිකාරිය වෙත පැවරෙන බව අවධාරණය කර සිටින මුත් එකම තොරතුරු ඉල්ලීම නැවත නැවතත් ගොනු කිරීම මගින් පනත ක්‍රියාත්මක කිරීමේ පරිපාලනමය කාර්යභාරයේ කාර්යක්ෂමතාවය අඩපන වන බව අභියාචකගේ අවධානයට යොමු කරනු ලැබේ.

තවද තොරතුරු පනතේ 43 වගන්තිය ප්‍රකාරව "තොරතුරු" යනු කවරක්ද යන්න අභියාචකගේ අවධානයට යොමුකර සිටී. එහි සඳහන් වන්නේ

> *'පහත සඳහන් ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසළකා, සටහන්, ලේඛන, සංදේශ, විද්‍යුත් තැපැල්, මත, උපදේශ, මාධ්‍ය නිවේදන, චක්‍රලේඛ, නියම, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, හුවමාරුවන ලිපි, සංදේශ, නීති කෙටුම්පත්, පොත්, පිඹුරු, සිතියම්, චිත්‍ර, රූප සටහන්, රූපමය හෝ ප්‍රස්ථාරමය වැඩ හෝ ඡායාරූප, සේයාපට, ක්ෂුද්‍ර සේයාපට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මඟින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය, ඇතුළු යම් ආකාරයකින් ලේඛනගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් ඇතුළත් වේ'.*

තොරතුරු ඉල්ලීමක් මගින් ලබා ගත හැකි වන්නේ එම ප්‍රශ්නයට අදාළ පිළිතුර 43 වගන්තියේ අර්ථනිරූපනය පරිදි වූ ලේඛන වල පොදු අධිකාරිය සන්තකයේ භාරයේ හෝ පාලනයේ පවතින්නේ නම් පමණි.

ඒ අනුව RTIC Appeal /1602/2019 යන අභියාචනයෙහි තීරණය මත පදනම්ව මෙම අභියාචනය අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

*****